'''
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2301/62 – 2022 ඔක්තෝබර් 15 වැනි සෙනසුරාදා – 2022.10.15

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/03/2019/295.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. පී. ඒ. ඩී. ඒ. කේ. කරුණානායක මයා, අංක 149/සී/1, බංගලාවත්ත, පූගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික අධ්‍යාපන ආයතනය, තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් ( විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, අංක 453/එෆ්, කුමාරි ජයරත්න මිය පත් කර ඇය වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ දීය.

මගේ අංකය: IR/COM/03/2019/295.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**( 1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

යූ. පී. ඒ. ඩී. ඒ. කේ. කරුණානායක මයා, අංක 149/සී/1, බංගලාවත්ත, පූගොඩ.

*සහ*

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික අධ්‍යාපන ආයතනය, තැ.පෙ. 21, හයිලෙවල් පාර, මහරගම.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ** –

''ජාතික අධ්‍යාපන ආයතනයේ සේවක යූ. පී. ඒ. ඩී. ඒ. කේ. කරුණානායක මහතාට,

1. අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර හිමි නම්, එය පුරප්පාඩු වූ දිනය වන 2011.03.21 වැනි දින සිට ලබා නොදීම හා අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) තනතුර දක්වා ලබා නොදුන් අභ්‍යන්තර උසස්වීම්වලට අදාළ සේවා කාලය සක්‍රීය සේවා කාලය ලෙස නොසැලකීම.

2. 2015 වර්ෂයේ සිට පරිපාලන නිලධාරි තනතුර ජාතික අධ්‍යාපන ආයතනයේ පනත හා *ගැසට් පත්‍රය* අනුව ස්ථාපිත ශ්‍රේණියෙන් පහත දැමීම හා එම තනතුර අනුමත වූ දිනය වන 2011.12.01 වැනි දින සිට තනතුරට අදාළ නියමිත ශ්‍රේණියේ ස්ථාපිත නොකිරීම.

යන කාරණා මගින් අසාධාරණයක් සිදුව තිබේ ද අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 23 වැනි දින,
කොළඹ කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 - 0137

---

මගේ අංකය: IR/COM/03/2020/91.
IR/COM/03/2020/203.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එස්. එම්. ධර්මරත්න මයා, අංක 27/2 බී, සේද මාවත, ඇල්දෙණිය, කඩවත.
2. එම්. එස්. පත්මසිරි මයා, අංක 436, ඇඹුල්ගම පාර, පනාගොඩ, හෝමාගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහ බැංකුව, 12 වන මහල, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බත්තරමුල්ල, කොස්වත්ත, රිචඩ් ද සොයිසා නිවාස සංකීර්ණය, අංක 4, නීතිඥ පියල් දර්ශන ගුරුගේ මයා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2020/91.
IR/COM/03/2020/203.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

1. එස්. එම්. ධර්මරත්න මයා, අංක 27/2 බී, සේද මාවත, ඇල්දෙණිය, කඩවත.
2. එම්. එස්. පත්මසිරි මයා, අංක 436, ඇඹුල්ගම පාර, පනාගොඩ, හෝමාගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා මහ බැංකුව, 12 වන මහල, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවය කරන ලද එස්. එම්. ධර්මරත්න මයා සහ එම්. එස්. පත්මසිරි මයා හට මාණ්ඩලික පන්තියට උසස්වීම් හිමි ද හිමි නම් එය ලබා නොදීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදුවී තිබේ ද එසේ නම් ඔවුන්ට ලැබිය යුතු සහනයන් කවරේ ද යන්න පිළිබඳව වේ,''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 ඔක්තෝබර් මස 07 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0138

---

මගේ අංකය: IR/COM/03/2021/155.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියමකර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශවයක් වශයෙන්,*

කේ. නාලනී ප්‍රේමලතා මිය, ''අමා'', මානිංගල, දුන්කන්නාව, නාත්තන්ඩිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක් හවුස් පටුමග, කොළඹ 15.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත

අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, ගොතටුව නව නගරය, කජුගහවත්ත, පෙට්‍රල් ෂෙඩ් ඉදිරිපිට පාර, අංක 16, නීතිඥ විජිතානන්ද මඩවලගම මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/03/2021/155.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශවයක් වශයෙන්,*
කේ. නාලනී ප්‍රේමලතා මිය, ''අමා'', මානිංගල, දුන්කන්නාව, නාත්තන්ඩිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*
ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාව, රොක් හවුස් පටුමග, කොළඹ 15.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,**

''1996.07.23 දින සිට ලංකා ධීවර වරාය නීතිගත සංස්ථාවේ සේවය කරන කේ. නාලනී ප්‍රේමලතා මහත්මියට,

1. 2009.11.03 වැනි දින සිට මාණ්ඩලික නිලධාරි තනතුරට උසස්වීමක් ලබා දී ඇති නමුත් 2013.06.01 දින දක්වා එම තනතුරට අදාළ වැටුප ලබා නොදීම.
2. 2009 සිට 2014 වසර වන විට වසර 05 කාලය සම්පූර්ණවීම මත MM-1-1-2016 ශ්‍රේණිය ලබානොදීම හා ඊට අදාළ වැටුපට අමතරව, රු. 5000/- ක වෘත්තීය දීමනාව ද හිමි නම් එය ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ලැබිය යුතු වෙනත් සහන කවරේද යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 සැප්තැම්බර් මස 27 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 10 – 0139

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.